# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2299/64 – 2022 සැප්තැම්බර් 30 වැනි සිකුරාදා – 2022.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2021/64.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්.ඩී.සීතා රංජනී මිය, අංක. 03, නඳුන් උයන, මත්තේගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පානළුව, පාදුක්ක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර-උතුර, අරංගල, රණමයුර මාවත, 453/එෆ් ,කුමාරි ජයරත්න මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනුෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 – 0364 /1

1A – G37673 – 09 (2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2021/64.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්.ඩී.සීතා රංජනී මිය, අංක. 03, නඳුන් උයන, මත්තේගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පානළුව, පාදුක්ක.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සේවය කළ එම්.ඩී.සීතා රංජනී මිය හට 2018.11.01 දින සිට වැටුප් ගැලපීම් කළ හැකි ද? වැටුප් ගැලපීම් කළ හැකි නම් 2018/2019 හා 2020 යන වර්ෂවලට අදාලව වැටුප් වර්ධක, ප්‍රසාද දීමනා හා හිඟ වැටුප් හිමි ද යන්නත් හිමි නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 09 – 0364 /2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.